

නිර්මාණ අඩවිය

ඉඳහිට දවසක
www.ketapathpawra.com
අඩවියට ගොඩවන්න

## සාන්තුවරුන්ගේ දේශය

කොන් හතරට සීල් තියපු
ජාතික කොඩි අන්දවාපු
පෙට්ටි වලින් ගෙදර වඩින
හතර රීයන් රුවන් පුත්තු

ලේ වැගිරෙන දෑතින් ගෙන
දෙකොනින් ඇවිලෙන විලක්කු
සිහල බිමේ යකා නටන
මිසදිටු සාතන් ගෙ පුත්තු

පන්සල් කෝවිලක් නෑර
දෙපා ගෙවෙන තෙක් ඇවිදින
නොලැබෙන දෙව් පිහිට යදින
කිසා ගෝතමී මව් වරු

පැණ විසඳන මහෞෂධ වරු
පර සක්වල සිට එන තුරු
ඇඟිලි ගණින කට බලියන
අති උත්තම පාලක වරු

චන්දෙන් චන්දෙට එලි වෙන
සාමෙක සුව සිහින දකින
නිදහස් නිවහල් රටකට
පෙරුම් පුරන සාන්තු වරු



**ශ්‍රියා කුමාරසිංහ**
නවසීලන්තය

## යුතනේසියා



කල්පයක් පවතින්න බැඳුනු බැමි
සුලං පහරින් වුනිය සුනු විසුනු
බිඳුනු හද කැඩපතකි වුනු කැබලි

ලේ මසින් සැදි සොඳුරු පැතුම් පොදි
වරක් නොව තුන් වරක් බිඳ වැටුනු
පැළුනු සිත දුක කෙලෙස දෝ දරනු

කුරිරු බව ලෝකයේ
රුදුරු බව ජීවිතේ
තවත් කොයි තරම් කල්
ඉවසම්ද මා?

ගල් බොරළු විස සපුන්
පතොක් කටු මිරිඟු දිය
තවත් කොයි තරම් කල්
ඉවසම්ද මා?

එපා රැය මැකෙන්නට
එපා හිරු නැගෙන්නට
එපා මල් පිපෙන්නට
එපා හද ගැහෙන්නට

මරණයද එකම තිර දේ ලොවේ?
මරණයයි එකම තිර දේ ලොවේ!

**රසිකා පෙරේරා** සිඩ්නි

## නොලියා ඉන්න බැරි කවි

කඳ මලු බැඳන් රට එනකොට කුමක් වැනී
මුල් වර ගමරාල දෙව් ලොව ගියා වැනී
ගුවන් තොටින් බැස බැලු විට කුමක් වැනී
නංගී පෙන්නලා අක්කා ලැබුන වැනී

කට්ට කකා වේලෙන කොට කුමක් වැනී
අයිස් ගැසූ පව් පටිසන් දෙනව වැනී
යලට මහට වැඩ ලැබුනම කුමක් වැනී
පණ යද්දී ලැබෙනා සේලයින් වැනී

සමහර රේඩියෝ බයිලා කුමක් වැනී
රිලවුන්ගෙන් අහන බොල් බණක් වැනී
හරවත් දෙයක් හමුවන විට කුමක් වැනී
අම්මා කැවූ බතක මතකයෙ සුවඳ වැනී

කීස්බරෝ සෑයේ කොත කුමක් වැනී
මේ මඩ ගොහොරුවේ පිපි තනි නෙලුම වැනී
මගෙ හිත එවිට කියනා දේ කුමක් වැනී
දැන් ගමරාල සිල් ගන්නට කාලෙ වගේ

**ඩබ්ලිව්. එච්. උපසේන**



## වත්තල සිට මීගමුවට

වත්තල පුරේ දෙව් මැදුරකි සිත් ගත්ත
බැලුවත් වතාවක් ඇති සත සැනසෙන්න
ආනා මුණි වරිය මැදුරේ වැඩ ඉන්න
රැක දෙයි ගැබිණි මවු වරු සිරිලක ඉන්න

පවිටු දනන් හට නිති යහ මග පෙන්වා
වනසා රෝග බිය සැම සිත සනසන්නා
සෙබස්තියන් මුණිවරයා වැඩ ඉන්නා
කළානේ මැදුර ස්වර්ගයෙ දොර වැන්නා

දෙව් මැදුරකිය සැමගේ සිත සනසන්ත
හැබැහින් වික්ෂෝප මාතා වැඩ ඉන්න
දැක ආශිර්වාද සෙනෙහස ලැබ ගන්න
බැති බර මිනිස ජා ඇල මැදුරට එන්න

ලක්දිව කලපුවකි දුටුවන් මන බඳින
සුරකියි පරිසරය එහි ඇති කඩොලාන
කිතු බැතිමතුන්ගේ මීගමු රජ දහන
පුංචි රෝමයකි මේ සිරි ලක මැවුණ

පෙන්වා මහිම පාමින් දෙව් රැස් දහරේ
වැඩ සිටිනා මරිය මාතා දෙව් මැදුරේ
කළ පව් සමා කරගන්නට මේ සසරේ
පිහිටයි මරිය මාතා මීගමු මැදුරේ

**ධර්මවර්ධන රණසිංහ**

## නුඹෙ ජීවය

හෙල උරුමය අමතක කර
ලොකු පුටු වල වැජඹෙන උන්
නුඹෙ දහදිය මිල කරන්නෙ
උගෙ බල තහවුරු කරන්න

නුඹ නැති දා මවු පියන්ට
නුඹෙ බිරියට සොහොයුරියට
ලොකු එවුන්ට නොහැකි වේවි
අඩු පාඩුව සපුර දෙන්න

රැකවරණය පසෙක තබා
සැප සම්පත් අතැර දමා
අවි දරන්නෙ රෑ රකින්න
නුඹෙ ජීවය දී

**චන්ද්‍රානි රාජකරුණා**
තෝමස්ටවුන්
වික්ටෝරියා

## මට කියනවද...?

සන්නස මා අත තැබූ ඔබ
පන්හිඳ තුඩැඟිලි මත තැබූ ඔබ
ලියන්නැයි ආයාචනා කළ ඔබ
රිද්මයේ හද රාවයයි

එහෙත් සබඳ....

තාලයක් නැති ගීතයක්
නළුවකු නැති රඟහලක්
මාවතක් නැති ප්‍රේමයක්
නිරුදක කතරක සිහිනයක්

කුමක් ලියන්නද
මං

**කාන්ති වික්‍රමසූරිය**

## වැලන්ටයින් උතුමාණනි..

තල් වැටේ මායිමේ
රුදුරු අවි අත දරන්
මරණයෙහි සෙවනැල්ල
සමග ආලය බැඳුනු
නව යොවුන් සිරුරු තුළ
නොමැතිවද ආදරය?

සඳ පහනේ වෙරළ දිගේ
සතුරන් හට ගිනි බිඳිද්දි
වැලන්ටයින් උතුමාණනි
ඔබේ පුතුන් රට රකිද්දි

එනවා නම් ඇවිත් යන්න
ක්ලෝඩියස්ලා බලන්න
වැලන්ටයින් දවසට උන්
බාල් නටන හැටි බලන්න

**ජගත් වෙත්තසිංහ**
ක්රෙගිබර්න්

## දුරු රට

නේක කවි පද ගැලූ මගේ සිතට
එකම එක කවක් වත් නොඑන්නට
පලා ගොස් දුරට
දරා ගන්නට බෑ මගෙ සිතට
මේ සීත දුරු රට
වැලපෙනවා තමයි
මමයි මගෙ කවි සිතයි
තනිවෙලා නොරට

තවම හැම හීනෙකම
ඉන්නෙ මම මගෙ රටේ
එරට මා දමා ආ හැම සෙනෙහෙ සිතැත්තොම
ඉන්නවා හිත යට
දෙරටකට සිර වෙලා රිදුම් දෙන කඳුල
ගලා යාදෙන් රහසේම යන්ට
මගෙ හිමියනුත් දියණියත් සෙනෙහසින්
ජීවය දෙයි මගෙ හිතට

**චාන්දනී කුලතුංග**
ක්‍රයිස්ට්චර්ච් නවසීලන්තය


සාදර අනුග්‍රහය

Disney Maintenance
DM
INDUSTRIAL
COMMERCIAL
DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022